හැදින්වීම

වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය බස්නාහිර පළාතේ කලුතර දිස්ත්‍රික්කයේ අගලවත්ත මැතිවරණ කොට්ඨාසයේ දකුණු භාගයේ දකුණු පළාත් සීමාවට මායිම්ව පිහිටා ඇත.

කලුතර දිස්ත්‍රික්කයේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අතරින් පොදු පහසුකම් ඌන ග්‍රාම නිලධාරී වසම් 60 කින් සමන්විත විශාලතම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ලෙස වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හඳුනාගනී.මෙය පැලවත්ත කලාපය, වලල්ලාවිට කලාපය හා ඉත්තපාන කලාපය යන කලාප තුනකින් සමන්විතවේ.

ඉත්තපාන කලාපයට අයත් 777 ඒ ඉත්තපාන බටහිර ග්‍රාම නිලධාරී වසම දූවගොඩ, පොල්වත්ත, එරඩුගොඩ හා බොරලුකැටියවත්ත යන ගම්මානවලින් සමන්විතව පවතී.

වසමෙහි ඓතිහාසික පසුබිම හා නම සෑදුනු ආකාරය

කෝට්ටේ සහ පාලින්ද නුවර ප්‍රාදේශීය රාජකාරී පැවති යුගයේ සිට මෙම ප්‍රදේශවල ජනතාව ජීවත්වූ බව ඉතිහාසයේ සඳහන්වේ.ඉත්තපාන ශ්‍රී සුදර්ශනාරාම විහාරස්ථානයේ විහාරාධිපතිව සිට 2001 වර්ෂයේ අපවත් වී වදාල පූජ්‍ය පත්බෙරියේ ඉන්ද්‍රානන්ද ස්වාමීන් වහන්සේ ලියූ පස්යොදුන් රට ඉතිහාසය නැමති කෘතියේ සඳහන් වන ආකාරයට වීදිය බණ්ඩාර නමැති සෙනෙවියා පාලින්ද නුවර සිට සේනා සංවිධානය කර බෙන්තර ගඟ හරහා සේනාව රැගෙන යුද්ධයට ගොස් ඇත.


ප්‍රදේශයේ වැඩිහිටි ජනතාව සඳහන් කරන ආකාරයට ඉත්තපාන ශ්‍රී සුනන්දාරාම විහාරස්ථානය අසල ඉදිරිපස ඉඩමක ගලු ගලක් තිබූ අතර එම ගලෙහි ඉත්තෑවෙක් සිට ඇත.ජනතාව එම ඉත්තෑවා පැන්නීමට උත්සාහ කලද එය අසාර්ථක ප්‍රයත්නයක් වූ බැවින් පහනක් පත්තුකර ඇත. ඒ අනුව ඉත්තෑවා පැන්නීමට පහනක් පත්තු කල බැවින් ඉත්තපාන වශයෙන් ප්‍රදේශය හඳුන්වන ලදී.

වසමට ප්‍රවේශ විය හැකි මාර්ග

01 අලුත්ගම නගරයේ සිට මතුගම ප්‍රධාන මාර්ගයේ පැමිණ ලෙව්වන්දුව මංසන්ධියෙන් දකුණු දෙසට හැරී අවිත්තාව දෙසට වැටී ඇති මාර්ගයේ ඉත්තපාන දෙසට පැමිණීම.

02 මතුගම නගරයේ සිට මීගහතැන්න හන්දියට පැමිණ දකුණට ඇති වලල්ලාවිට අලුත්ගම මාර්ගයේ අවිත්තාව පසුකර ඉත්තපාන හන්දියට පැමිණ මීටර් 600ක් පමණ ඉදිරියට පැමිණීම.

03 ඇල්පිටිය නගරයේ සිට අවිත්තාව මාර්ගයේ අවිත්තාවට පැමිණ වමට වැටී ඇති අලුත්ගම මාර්ගයේ ඉත්තපාන හන්දිය පසුකර මීටර් 600ක් පමණ ඉදිරියට පැමිණීම.


අලුත්ගම
වැලිසැන්න පිවිසුම
මහගම
මලේවන්දුව හංදිය
දක්ෂිණ අධිවේගී
මාර්ගය
ගාල්ල පාර
ඉත්තපාන
මීගම පාර
දක්ෂිණ අධිවේගී
මාර්ගය
මහගම දෙසින්
වලල්ලාවිට දෙසින්
අලුත්ගම දෙසින්
අවිස්සාව

පිහිටීම

1. පළාත - බස්නාහිර
2. දිස්ත්‍රික්කය - කලුතර
3. මැතිවරණ කොට්ඨාසය (ආසනය) - අගලවත්ත
4. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - වලල්ලාවිට
5. පළාත් පාලන ආයතනය - ප්‍රාදේශීය සභාව
6. ග්‍රාම නිලධාරී කොට්ඨාසය - ඉත්තපාන බටහිර
7. ග්‍රාම නිලධාරී කොට්ඨාස අංකය - 777 A
8. මායිම්

   උතුරු - ඉත්තපාන උතුර ග්‍රාම නිලධාරී වසම

   දකුණු - . ඉත්තපාන දකුණ ග්‍රාම නිලධාරී වසම

   නැගෙනහිර - මාලඹේහේන ග්‍රාම නිලධාරී වසම

   බටහිර - වැලිපැන්න ගග

9. ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ස්වභාවය (ග්‍රාමීය/නාගරික/අර්ධ නාගරික/වතු) - ග්‍රාමීය
10. අයත් වන ගම්මාන - දුවගොඩ,පොල්වත්ත,එරඹුගොඩ,බොරලුකැටියවත්ත,
11. වසමේ විශාලත්වය - හෙක්ටයාර් 212

භූ විෂමතාවය, ස්වාභාවික සම්පත් හා දේශගුණය

1 භූ විෂමතාවය

භූමියේ සාමාන්‍ය ස්වභාවය - රැළි බිම සහ වගුරු සහිත බිම්

පස් වර්ගය - ගොඩබිම පස දුඹුරු පැහැයට හුරු රතු මැටි පසක් හා බොරලු සහිත පසක්

2. ස්වාභාවික සම්පත්

වැලිපැන්න ගඟ ආශ්‍රිත කඩොලාන පරිසරය

3. දේශගුණය

1 සාමාන්‍ය වාර්ෂික උෂ්ණත්වය (සෙ.ග්‍රේ.අංශක)	- 27
2 සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය (මි.මී.)	- 4000
3 දේශතුණික කලාපය	- පහතරට තෙත් කලාපය
4 ප්‍රධාන වශයෙන් වර්ෂාපතනය ලැබෙන කාලය	- නිරිත දිග මෝසම් මගින් මැයි සිට සැප්තැම්බර් දක්වා
5 සුළු වශයෙන් වර්ෂාපතනය ලැබෙන කාලය	- දෙසැම්බර් සිට මාර්තු දක්වා